# <u>තරඟ කොන්දේසි</u>

i. මේ සඳහා සහභාගී විය හැක්කේ බස්නාහිර පළාතේ පදිංචිකරුවන් සඳහා පමණි.

ii. මෙම වැඩමුළුව හා තරඟාවලිය පහත සඳහන් වයස් කාණ්ඩ තුන යටතේ ක්‍රියාත්මක වන අතර, 2025.04.30 වන විට නියමිත වයස සපුරා තිබිය යුතුය.

- කණිෂ්ඨ අංශය - 08 ශ්‍රේණිය සිට 10 ශ්‍රේණිය
- ජ්‍යෙෂ්ඨ අංශය - 11 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය
- විවෘත අංශය - වයස අවු. 19 – 25 දක්වා

iii. අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී පාසල් අයදුම්කරුවෙක් නම් විදුහල්පති විසින්ද, විවෘත අයදුම්කරුවෙක් නම් පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින්ද සහතික කර තිබිය යුතුය.

iv. සෑම තරඟකරුවෙක්ම තරඟය සඳහා ඉදිරිපත්වීමේදී අනන්‍යතාවය සනාථ කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත / තැපැල් හැඳුනුම්පත / වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක්, ග්‍රාම නිලධාරී / විදුහල්පති / විහාරාධිපති හෝ රජයේ පිළිගත් නිලධාරියෙකු විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය. ඊට අමතරව හැඳුනුම්පතක් නොමැති පාසල් අයදුම්කරුවන් සඳහා උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ද ඉදිරිපත් කළ යුතුවේ.

v. දිස්ත්‍රික්ක මට්ටමින් ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් තෝරාගනු ලබන අතර, කොළඹ, ගම්පහ හා කළුතර යන දිස්ත්‍රික්ක මට්ටමෙන් තෝරා ගත් ස්ථාන තුනකදී දිස්ත්‍රික් තරඟ පවත්වනු ලැබේ.

vi. දෙනු ලබන මාතෘකාව යටතේ ලබා දෙන කාලය තුළදී අයදුම්කරු විසින් චිත්‍රය ඇඳ නිමකල යුතුය.

vii. කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ හා විවෘත යන අංශයන්ගේ ජයග්‍රහකයින් සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් සහතික පත්‍ර, කුසලතා හා මූල්‍ය ත්‍යාග පිරිනමනු ලැබේ.

viii. දිස්ත්‍රික්ක මට්ටමෙන් ජයග්‍රහකයින් පළාත් තරඟාවලිය සඳහා යොමු කර, අංශ තුනේම ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන සඳහා සහතික පත්‍ර හා මූල්‍ය ත්‍යාග පිරිනමන අතර ප්‍රථම ස්ථානය සඳහා සම්මානයක් ද පිරිනමනු ලැබේ.

ix. ජයග්‍රහණ හිමිකරගත් තරඟකරුවන් සඳහා, සම්මාන / ත්‍යාග සහ සහතික පත්‍ර උත්සවාකාරයෙන් පිරිනමනු ලැබේ.

x. මෙම තරඟය සඳහා සහභාගී වී, ජයග්‍රහණ හිමිකර නොගත් සියළුම තරඟකරුවන් සඳහා පළාත් තරඟයට සමගාමීව දිස්ත්‍රික් තරඟයේ සහභාගීත්ව සහතිකයක් පිරිනමනු ලැබේ.

xi. අයදුම්පත් යොමු කිරීමේදී අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර **“ බස්නාහිර පළාත් චිත්‍ර වැඩමුළුව හා තරඟාවලිය - 2025”** යනුවෙන් සඳහන් කළ යුතුය.

xii. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.04.30 වන දිනට ප්‍රථම ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ **“බස්නාහිර පළාත් සංස්කෘතික නිලධාරී”** වෙත ලබා දිය යුතුය.

- **වැඩිදුර විස්තර සඳහා පහත නිලධාරීන් සම්බන්ධ කර ගැනීම මැනවි.**

i. ඩබ්.කේ අනෝමා ප්‍රියංගනී ( සංස්කෘතික නිලධාරී ) - 071 569 8197 - කළුතර දිස්ත්‍රික්කය

ii.ඒ.ඩී.එච්.කේ.අළුත්වත්ත මයා ( සංස්කෘතික නිලධාරී) - 071 901 9675 - කොළඹ දිස්ත්‍රික්කය

iii. එම්.ටී. කෝට්ටවත්ත මිය (සංස්කෘතික නිලධාරි) - 0712940770 - කළුතර දිස්ත්‍රික්කය

iv.ආර්.එම්.එන්.ඩී. බණ්ඩාර මිය (සංවර්ධන නිලධාරි - සංස්කෘතික) 0787366992 - ගම්පහ දිස්ත්‍රික්කය

අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය,
නව පළාත් සභා කාර්යාල සංකීර්ණය,
2වන මහල.
අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
විමසීම් - එස්. ගමනායක මිය (සංවර්ධන නිලධාරි) – 011-2093105